# නර්තනය - 10 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

# ***<u>හෝමාගම අධ්‍යාපන කලාපය</u>***
# ***<u>ස්වයං අධ්‍යයන ඉගෙනුම් අත්වැල</u>***
# ***<u>නර්තනය - 10 ශ්‍රේණිය</u>***

- නිපුණතාව- ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.
- නිපුණතා මට්ටම-ශ්‍රී ලාංකීය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික පසුබිම විග්‍රහ කරයි.
- විෂය අන්තර්ගතය-විදේශිකයන්ගේ ඓතිහාසික වාර්තා

## <u>මහාවංශයේ සාධක</u>

මිනිස් සංහතියේ ආරම්භය තෙක් ඈතට විහිදී යන නර්තන කලාව විවිධ කාලවල දී විවිධ ස්වරූපයෙන් වෙනස්කම් වලට බඳුන් වෙමින් ඉදිරියට ගලා ආ බව පසුගිය වසර වල දී ඔබ අධ්‍යයන කල අයුරු නැවත ආවර්ජනය කර ගන්න.

**නර්තන කලාව පිළිබඳව තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර**

1. වංශකථා

2.පුරාවිද්‍යාත්මක සාධක

3.ශිලා ලේඛන

4.සාහිත්‍යය කෘති

5.දේශකයන්ගේ වාර්තා

6.ජනප්‍රවාද හා ජනශ්‍රැති

**වංශකථා ඇසුරින් නර්තන කලාව පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරමු.**

- වංශකථා
    1. මහාවංශය
    2. දීපවංශය
    3. ථූපවංශය
    4. චූලවංශය

***මහාවංශයේ සාධක***

1.විජය හා කුවේණි එක් වූ දින රාත්‍රියේ සිරසවත්තුපුරයේ පැවති විවාහ මංගල උත්සවයක නැටුම්, ගැයුම්, වැයුම් පැවති බව .

2.අනුරාධපුර යුගයේ ආරම්භක පාලකයා ලෙස සැලකෙන පණ්ඩුකාභය රජු සමයේ උත්සව අවස්ථාවාදී චිත්තරාජ,කාලවේල යන යක්ෂයන් උදෙසා සම අසුන් පනවා රජු ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවූ බව.

3.දුටු ගැමුනු රජු නළගනන් 16000 ක් පිරිවරාගෙන කන්ඩුල ඇතු පිට නැගී පංචතූර්‍ය වාදන සහිතව රුවන්වැලිසෑයේ ධාතු නිධන් කිරීමේ උත්සවයට ගිය බව.

4.මහා දැළියාමානා හෙවත් මහා දාඨිය මහානාග රජු ගිරි භාණ්ඩ පූජාවක් කල බවත් එම උත්සවයේදී වීදි සහ සතර දොරටු සරසවා තොරන් බදවා පහන් දල්වා නැටුම් ගැයුම් පැවැත්වූ බවත් රනින් කල බෙර අටක් වාදනයට අණ කල බවත් සදහන් වේ.

5.භාතිකාබය රජු මහා බෝධිය සදහා නානුමුර මංගල්‍යයක් පැවැත්වූ බවත් ඒ සදහා නැටුම් හා වාදන පැවැත්වූ බවත් සදහන් වේ.

6.පොළොන්නරු රාජධානියේ රජ කල මහා පරාක්‍රමබාහු රජු නැටුම් ,ගැයුම් ,වැයුම් පැවැත්වීම සදහා සරස්වතී මණ්ඩපය ඉදි කල බවත් රජුගේ බිසව වන රූපාවතී බිසව ඇතුළු නළු නිළියන් එහි ලංගනෝප් යෙදුන බවත් සදහන් වේ.

***චූලවංශයේ සාධක***

1.සරස්වතී මණ්ඩපය රන් ආලේපිත කුලුනු සහිත බවත් චීන පට සලු වලින් අලංකාර කල බවත් රජුගේ සෙබළුන්ගේ ආස්වාදය සදහා එහි නැටුම් ,ගැයුම් ,වැයුම් පැවැත් වූ බවත් සදහන් වේ.


2.පරාක්‍රමබාහු රජු දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කිරීමට සෑදූ විශේෂ මණ්ඩපයේ අලංකාර ආභරණ වලින් සැරසුණු නළගනන් නැටූ බවත් බටනලා,වීනා,බෙර,වාදන පැවැත්වූ බවත් සදහන් වේ.

*සරස්වතී මණ්ඩපය*



***<u>විදේශිකයින්ගේ වාර්තා ඇසුරෙන් නර්තන කලාවේ ඉතිහාසය උගනිමු.</u>***

- **ඉබන් බතූතාගේ වාර්තාව**



1.14 වන සියවසේ ගම්පොළ යුගයේ දී ලංකාවට පැමිණි මොහු විදේ ශීන් දුටු පුරාණ ලංකාව නම් පොතෙහි නර්තන කලාව පිලිබද මෙසේ සදහන් කර ඇත.

2. "දෙවුන්දර උපුල් වන් දේවාලයේ මිනිස් ප්‍රමාණ උස ඇති දව් රුවක් අබියස පන්සීයක් පමණ හින්දු බාලිකාවන් ගී ගයා නැටූ බව."

3.හින්දු බාලිකාවන් නැටූ බව සදහන් වීමෙන් පැහැදිලි වන්නේ මෙම යුගයේ නර්තනය සදහා හින්දු ආභාසය ලැබී ඇති බවයි.

- ස්පිල් බර්ජන් වාර්තාව



1. මහනුවර යුගයේ පළමු වන විමලධර්මසූරිය රජු කල ලංකාවට පැමිණි ලන්දේසි ජාතික ස්පිල් බර්ජන් නර්තන කලාව පිලිබඳ මෙසේ දක්වා ඇත.

2. "මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්. ඔවුන්ගේ උඩු කය නග්න වූ අතර යටි කයේ වැඩ දැමූ වස්ත්‍ර ඇත්තේය.

- රොබට් නොක්ස්



1.මහනුවර යුගයේ දෙවන රාජසිංහ රජු සමයේ ලංකාවට පැමිණ වසර 18ක් එළිමහන් සිර කරුවෙකු ලෙස සිටි ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් ලියූ" එදා හෙළ දිව" පොතෙහි මෙසේ දක්වා ඇත.

2. "එහි විහාර දේවාල වල තේවාව සදහා නියම වූ කුල වලින් පැමිණ කළ ගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනෝ වෙති. ඔවුන්ට නියම වූ විවිධ ක්‍රීඩා කරමින් තුන් දෙනා බැගින් අතින් අතිනත ගෙන රඟන ස්ත්‍රීහු වෙති.

**පසුගිය විභාග ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

- ***2015***

(1) පත්‍රය.

(11)."විහාර දේවාල වල තේවාව සඳහා නියම වූ කුල වලින් පැමිණ කළ ගෙඩි සෙල්ලමේ යෙදෙන නළගනෝ වෙති" මෙම සටහන කරන ලද්දේ,

(1).ඉබන් බතූතා

(2).පාහියන් භික්ෂුව

(3).රොබට් නොක්ස්

(4).ස්පිල් බර්ජන්

- ***2016***

(1)පත්‍රය .

(12)චිත්ත රාජ නම් යක්ෂයා සමග සම අසුන් ගෙන දෙවු මිනිස් නැටුම් කරවූ බව සඳහන් වන්නේ,

(1).පණ්ඩුකාභය රජු

(2).දුටු ගැමුණු රජුය

(3).පඩුවස්දෙව් රජුය

(4).පරාක්‍රමබාහු රජුය

- ***2017***

(1) පත්‍රය

(10) එදා හෙල දිව කෘතිය රචනා කරන ලද්දේ ................................. ඉංග්‍රීසි ජාතිකයාය.

(1).ජෝන් ඩොයිලි

(2).ජෝන් කැලවේ

(3).රොබට් නොක්ස්

(4).ස්පිල් බර්ජන්

(3) කොටස.

(1) "මහනුවර පෙරහැරේ රුමත් තරුණියෝ ලස්සනට නටත් ඔවුන්ගේ උඩු කය නග්න වූ අතර යටි කයේ වැඩ දැමූ වස්ත්‍ර ඇත්තේය. යනුවෙන් සටහන් කර ඇත්තේ මහනුවර යුගයේ ලංකාවට පැමිණි ..................................නැමැති ලංදේසි ජාතිකයා විසිනි.

➢ ***2018***

(1) පත්‍රය

(9).සරස්වතී මණ්ඩපය පොලොන්නරු යුගයේ දී..........................රජු විසින් ඉදි කල බව චූල වංශයේ සඳහන් වේ.

(1).දෙවන පරාක්‍රමබාහු රජ

(2).පලවන පරාක්‍රමබාහු රජ

(3).දෙවන රාජසිංහ රජ

(4).කීර්ති ශ්‍රී රාජසිංහ රජ

මෙම පාඩම ඉගෙනීමෙන් පසු ඔබ ,

(1).දේශාටන වාර්තා සහ වංශකතා අනුව ආගමික හා සමාජීය අවශ්‍යතා සඳහා නර්තනය යොදා ගෙන ඇති ආකාරයත්

(2).නර්තනයේ දියුණුව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබුණු ආකාරයත්

(3).එකල පැවති වාදන භාණ්ඩ සහ ඇඳුම් පැලඳුම් පිලිබඳවත් උගත්තේය.

## පැවරුම (1).

(1)නර්තන කලාව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබුණු ආකාරය වගු ගත කරන්න.


| වංසකථා හා දේශාටන වාර්තා | දායක වූ රජවරුන් හා විදේශ සංචාරකයන් | නර්තනය භාවිත කළ අයුරු |
| --- | --- | --- |
| මහාවංශය | පණ්ඩුකාභය රජු | • ........................<br>• ........................ |
| | දුටුගැමුණු රජු | • ........................<br>• ........................ |
| | මහාදළියාමානා රජු | • ........................<br>• ........................ |
| | භාතිකාභය රජු | • ........................<br>• ........................ |
| | මහා පරාක්‍රමබාහු රජු | • ........................<br>• ........................ |
| චූලවංශය | පරාක්‍රමබාහු රජු | • ........................<br>• ........................ |
| විදේශීන් දුටු පුරාණ ලංකාව | ඉබන් බතුතා | • ........................<br>• ........................ |
| වාර්තාව | ස්පිල් බර්ජන් | • ........................<br>• ........................ |
| ...දා හෙළදිව | රොබට් නොක්ස් | • ........................<br>• ........................ |

## පැවරුම(2).

ඔබ උගත් කරුණු අනුව අතීතයේ ආගමික හා සමාජ අවශ්‍යතා වලදී නර්තන ගායන වාදන යොදා ගෙන ඇති ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න.

## පැවරුම (3)

පහත ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.



හරහට,

1.ස්පිල් බර්ජන් ලංකාවට පැමිණි යුගයයි .

2.රොබට් නොක්ස් කල ගෙඩි සෙල්ලමේ යෙදුණු බව සඳහන් කලේ මෙම බාලිකාවන් ය.

3.නව වන ශ්‍රේණියේදී නර්තන කලා ඉතිහාසය උගත් මූලාශ්‍රය කි.

5.අතීතයේදී ඉතිහාස තොරතුරු ලබා ගැනීමට මේවාද උපකාරී විය.

6.අනුරාධපුර යුගයේ දී නර්තන කලාවේ දියුණුවට කටයුතු කල රජ කෙනෙකි.

පහලට ,

3.පරාක්‍රමබාහු රජු විසින් ඉදි කල මණ්ඩපය යි.

4.නර්තන කලාව පිලිබඳ තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍රයකි .

7. හින්දු බාලිකාවන් අතේ තබා නැටූ රංග භාණ්ඩ යයි.

2.අනුරාධපුර යුගයේ ආරම්භක පාලකයා ලෙස සැලකෙන පණ්ඩුකාභය රජු සමයේ උත්සව අවස්ථාවල දී චිත්තරාජ,කාලවේල යන යක්ෂයන් උදෙසා සම අසුන් පනවා රජු ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවූ බව.

3.දුටු ගැමුනු රජු නළගනන් 16000 ක් පිරිවරාගෙන කන්ඩුල ඇතු පිට නැගී පංචතූර්‍ය වාදන සහිතව රුවන්වැලිසැයේ ධාතු නිධන් කිරීමේ උත්සවයට ගිය බව.

4.මහා දැළියාමානා හෙවත් මහා දාඨික මහානාග රජු ගිරි භාණ්ඩ පූජාවක් කල බවත් එම උත්සවයේදී වීදි සහ සතර දොරටු සරසවා තොරන් බඳවා පහන් දල්වා නැටුම් ගැයුම් පැවැත්වූ බවත් රනින් කල බෙර අටක් වාදනයට අණ කල බවත් සඳහන් වේ.

5.භාතිකාබය රජු මහා බෝධිය සඳහා නානුමුර මංගල්‍යයක් පැවැත්වූ බවත් ඒ සඳහා නැටුම් හා වාදන පැවැත්වූ බවත් සඳහන් වේ.

6.පොළොන්නරු රාජධානියේ රජ කල මහා පරාක්‍රමබාහු රජු නැටුම් ,ගැයුම් ,වැයුම් පැවැත්වීම සඳහා සරස්වති මණ්ඩපය ඉදි කල බවත් රජුගේ බිසව වන රූපාවතී බිසව ඇතුළු නළු නිළියන් එහි රංගනෝ යෙදුන බවත් සඳහන් වේ.